# විපක්ෂ නායක - ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

எதிர்க்கட்சித் தலைவர் - இலங்கைப் பாராளுமன்றம்

**LEADER OF THE OPPOSITION - PARLIAMENT, SRI LANKA**

SECRETARY GENERAL'S OFFICE, PARLIAMENT
11.41 am
23 NOV 2023
KOTTE

**2023.11.23**

## ස්ථාවර නියෝග 27(2) යටතේ අසනු ලබන ප්‍රශ්නය - 2023.11.24

රටේ මූල්‍ය පද්ධතියේ හා බැංකු පද්ධතියේ ස්ථාවරත්වය දැඩිව එකිනෙකට බැඳුනු කාරණා වේ. ලංකාවේ ප්‍රමුඛතම රාජ්‍ය බැංකු 02 ක් වන ලංකා බැංකුව සහ මහජන බැංකුවෙහි මහා පරිමාණ පෞද්ගලික ණය කරුවන්ගෙන් ණය නැවත අය නොකර ගන්නා හෝ බොල් ණය ලෙස කපා හැරීම් හෝ සිදු කරන බවට ජනතාව අතර බරපතල කුකුසක් පවතී.

බැංකුවක ප්‍රධානතම ආදායම් මාර්ගය වන්නේ ණය ලබා දීම මත අය කර ගන්නා පොලියයි. යම් බැංකුවක් තමා විසින් ලබා දී ඇති විශාලතම ණය කරුවන්ගෙන් මුදල් අය නොකර ගන්නේ නම් එම බැංකුව නිතැතින්ම ද්‍රවශීලතා අර්බුදයකට ගමන් කළ හැකිය.

ඒ අනුව, පහත සඳහන් ප්‍රශ්න වලට නිශ්චිත පිළිතුරු හා පැහැදිලි කිරීම් රජයෙන් බලාපොරොත්තු වෙමි.

**01.** මේ වන විට ලංකා බැංකුව හා මහජන බැංකුව වෙත ණය නොගෙවන පුද්ගලයන් හෝ පුද්ගලික සීමිත සමාගම් ලෙස හෝ හඳුනාගෙන ඇති වැඩිම ණය මුදලක් ගෙවිය යුතු පුද්ගලික ණය කරුවන් 10 දෙනා කවුරුන්ද? ඔවුන්ගේ ණය ප්‍රමාණයන් කවරේද? සහ ඔවුන්ගෙන් අයවිය යුතු පොලී ප්‍රමාණයන් කොපමණද?

**02.** එවන් ඉහළම ණය කරුවන්ගෙන් ණය වාරික හෝ පොලී මුදල් අයකර නොගැනීමට තීරණය කොට ඇත්ද? එසේ නම් ඒ කුමන ණය කරුවන්ගෙන් කුමන ප්‍රමාණ වලින්ද? එසේ ණය අය කර නොගැනීමට හෝ වෙනත් ආකාරයකින් කපා දැමීමට හෝ දැනට ඇති නීතිමය ප්‍රතිපාදන කවරේද? එසේ කපා දැමීමට තීරණ ගත්තේ නම් ඊට හේතු වූ කරුණු මොනවාද?

**03.** මෙසේ මහා පරිමාණ ණය කරුවන්ගෙන් ණය අයකර නොගැනීම මත බැංකුවේ ද්‍රවශීලතාවන්ට හා අනෙකුත් තැන්පත්කරුවන්ගේ ඉතුරුම් අයිතිවාසිකම් වලට ගැටලු ඇති නොවන අයුරින් මෙවන් ණය අයකර ගැනීම සඳහා නිශ්චිත වැඩපිළිවෙලක් මෙම බැංකු 02 සතුව පවතීද? ඒ කුමක්ද?

**04.** බැංකු මගින් පුද්ගලික සීමිත සමාගම්වලට හෝ පුද්ගලයන්ට මහා පරිමාණ ණය ලබා දීමේදී එම ණය නැවත අය කර ගැනීමේ හැකියාව සම්බන්ධයෙන් සලකා බැලීමට හා නැවත ණය අයකර ගැනීමට රටේ පවතින නීති ප්‍රමාණවත්ද? නො එසේ නම් ඒ සම්බන්ධයෙන් නීති සංශෝධනයක් සඳහා විශේෂ අධ්‍යයනයක් කර තිබේද? ඒ කුමක්ද?

සජිත් ප්‍රේමදාස (පා.ම.)
විපක්ෂ නායක

පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ, ශ්‍රී ලංකාව/பாராளுமன்றம், ஸ்ரீ ஜயவர்த்தனபுர கோட்டே, இலங்கை/Parliament, Sri Jayewardenepura Kotte, Sri Lanka.

දුරකථන/ தொலைபேசி/Telephones : 0112777253 / 0112777261 ෆැක්ස්/தொலைநகல்/Fax : 0112777257

CamScanner